# මාධ්‍ය නිවේදනය

**ජාතික රක්ෂණ දිනයේදී (සැප්තැම්බර් 1) සහ රක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ මාසයේදී රක්ෂණය ගැන දැනුවත් වෙමු.**

ජාතික රක්ෂණ දිනය ලෙස සැප්තැම්බර් පළමුවනදා සහ සැප්තැම්බර් මාසය "රක්ෂණ දැනුවත් කිරීමේ මාසය" ලෙස ද හඳුන්වනු ලැබේ. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) රක්ෂණ ක්ෂේත්‍රය සමඟ එක්ව සැප්තැම්බර් මාසය පුරාවටම රක්ෂණය පිළිබඳව දැනුවත් කිරීම සඳහා විවිධ වැඩසටහන් සංවිධානය කර ඇත.

රක්ෂණ කර්මාන්තයේ නියාමකයා ලෙස, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) රක්ෂණ ඔප්පුහිමියන් සහ අනාගත රක්ෂණ ඔප්පුහිමියන් ආරක්ෂා කිරීමට සහ හිරසාර රක්ෂණ කර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම උදෙසා කැපවී සිටී. රක්ෂණ කර්මාන්තය වෘත්තීය ව්‍යාපාරයක් ලෙස ක්‍රියාත්මක වන බව සහතික කරමින්, නියාමනය සහ අධීක්ෂණය හරහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) රක්ෂණ සේවා සපයන්නන් සහ රක්ෂණ ඔප්පුහිමියන් යන දෙපාර්ශවයේම සාර්ථකත්වයට මඟ පෙන්වයි. රක්ෂණ අවශ්‍යතා සම්බන්ධයෙන් දැනුවත්භාවයෙන් තීරණ ගැනීමට අවශ්‍ය දැනුමෙන් සෑම පුද්ගලයෙකුම සහ ව්‍යාපාරයක්ම සවිබල ගැන්වීම, රක්ෂණය පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම මඟින් රක්ෂණයේ ප්‍රවේශය පුළුල් කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) කැපවී සිටී.

ජාතික රක්ෂණ දිනය, එනම් සැප්තැම්බර් මස පළමුවනදා ආරම්භය සනිටුහන් කරමින් රක්ෂණය පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීම සහ රක්ෂණයේ වැදගත්කම පෙන්වා දීම සඳහා වූ විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කර ඇත. මෙම ක්‍රියාකාරකම් අතරට, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ ෆේස්බුක් පිටුව හරහා වයස අවුරුදු 8 සිට 18 දක්වා පාසල් ළමුන් සඳහා "සිත්තරා" නමින් මාර්ගගත චිත්‍ර තරඟයක් සහ රක්ෂණය ප්‍රචලිත කිරීම සඳහා මහජනතාවගේ යෝජනා ලබා ගැනීම මෙන්ම සමාජ මාධ්‍ය හරහා රක්ෂණ දැනුම වැඩි දියුණු කිරීම, පුවත්පත් නිවේදන සහ රක්ෂණය පිළිබඳව SMS පණිවිඩය යැවීම වැනි වැඩසටහන් මීට ඇතුළත් වේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) සියලුම පුරවැසියන්ට මෙම ක්‍රියාකාරකම්වලට සක්‍රීයව සහභාගී වීමට දිරිමත් කරන අතර රක්ෂණයේ වැදගත්කම පිළිබඳව තව දුරටත් දැන ගැනීමට මෙම අවස්ථාව උපයෝගී කර ගන්නා ලෙස ආරාධනා කරයි.

මෙම ක්‍රියාකාරකම් පිළිබඳ වැඩිදුර තොරතුරු සහ ඉදිරි ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ (IRCSL) වෙබ් අඩවියට සහ සමාජ මාධ්‍ය නාලිකා වෙත පිවිසෙන ලෙස ද ආරාධනා කරයි.

https://www.facebook.com/Ircslofficialpage

https://www.linkedin.com/company/78460854/admin/page-posts/published/

https://www.youtube.com/@ircsl6502/videos

https://ircsl.gov.lk/


**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව**
**11 වන මහළ, නැගෙනහිර කුළුණ,**
**ලෝක වෙළඳ මධ්‍යස්ථානය කොළඹ 01**

| | |
|---|---|
| Website: www.ircsl.gov.lk | Email: info@ircsl.gov.lk |
| Telephone: 011 2396184 -9 | Fax: 011 2396190 |


**30/08/2024**